මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.05.07 |

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත (කල්බදු මූල්‍යකරණ පනත) සංශෝධනය සඳහා මහජන අදහස් විමසීම**

කල්බදු මූල්‍යකරණ පාරිභෝගිකයන් සඳහා පවතින ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා සහ කල්බදු මූල්‍යකරණ කර්මාන්තයේ වර්ධනයන් සලකා බලමින් කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගනිමින් සිටී.

කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනයේදී උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ පුළුල් සහභාගීත්වය තහවුරු කිරීම සඳහා මහජනතාවගේ නිරීක්ෂණ / අදහස් / යෝජනා ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදහස් කර ඇත.

යෝජිත සංශෝධන සඳහා වන කෙටුම්පතට ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පනත සබැඳිය හරහා ප්‍රවේශ විය හැක.

“https://www.cbsl.gov.lk/si/මහජන-අදහස්-සඳහා-උපදේශන-පත්%E2%80%8Dරිකා”

කල්බදු මූල්‍යකරණ පනතට යෝජිත සංශෝධන පිළිබඳව තම නිරීක්ෂණ / අදහස් / යෝජනා, "කල්බදු මූල්‍යකරණ පනතට යෝජිත සංශෝධන පිලිබඳ නිරීක්ෂණ / අදහස් / යෝජනා " යන උද්ධෘතය යටතේ 2024 මැයි මස 31 වන දිනට පෙර තැපැල් මඟින්, ෆැක්ස් මඟින් හෝ ඊ තැපැල හරහා යොමු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙත ආරාධනා කර සිටී.

තැපැල් ලිපිනය :- අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

ෆැක්ස් අංකය :- 011 2477738

ඊ ලිපිනය :- dsnbfi@cbsl.lk